සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

## බුද්ධ ධර්මය

7 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් 40 ක් හිමිවේ.

---

### I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයට පත් වූ පසු ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස ගතකළ සති ගණන වන්නේ,

(i) සති 05 කි (ii) සති 06 කි (iii) සති 07 කි (iv) සති 04 කි

02 සුළු පියා ගේ තාඩන පීඩන වලට ලක්වූ අයෙකි.

(i) සුනීත (ii) සෝපාක (iii) රජ්ජුමාලා (iv) මාගන්දියා

03 " ආදර්ශවත් නායකත්වය " යන පාඩමට අදාල ජාතක කථාව මින් කුමක්ද?

(i) සුතසෝම ජාතක කථාවයි. (ii) මඛාදේව ජාතක කථාවයි.

(iii) ලෝමහංස ජාතක කථාවයි. (iv) අපණ්ණක ජාතක කථාවයි.

04 සිඟාලෝවාද සූත්‍රයට අනුව සදිසා නමස්කාරයේ ගුරුවරුන් / සිසුන් වෙන්කර ඇති දිසාව?

(i) දකුණු දිසාවයි. (ii) බටහිර දිසාවයි.

(iii) උතුරු දිසාවයි. (iv) නැගෙනහිර දිසාවයි.

05 ඉවසීම ප්‍රගුණ කරගත් තෙරුන් වහන්සේ නමකි,

(i) රාහුල තෙරුන් වහන්සේ (ii) සැරියුත් තෙරුන් වහන්සේ

(iii) පුණ්ණ තෙරුන් වහන්සේ (iv) මහා කාශ්‍යප තෙරුන් වහන්සේ

- **අංක 06 සිට 10 දක්වා ප්‍රකාශ හරිනම් ( ✓ ) ලකුණුද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

06 පැරණි ජන සමාජය විහාරස්ථානය ඇසුරු කර ගනිමින් සිරිත් විරිත් අනුගමනය කර තම ජීවිත සරු කර ගත්හ. ( )

07 ලොකු කුඩා සියලුම දෙනා විහාරස්ථානයේ වැඩ වාසය කරන භික්ෂු නායකත්වයට ගරු කළහ. ( )

08 ලොව උපන් සියලු මිනිස්සු හිංසා පීඩාවන්ට ලක්ව ජීවත් වීමට කැමති වෙති. ( )

09 ධනංජය සිටුතුමා තම දියණිය වන විශාඛාවට යුග දිවිය සාර්ථක කර ගැනීමට වැදගත් උපදෙස් 10 ක් ලබා දුන්නේ ය. ( )

10 කහවනු දහ අට කෝටියක් වැය කර අනේපිඬු සිටුතුමා විසින් ඉදිකරනලද ආරාමය වන්නේ ථූපාරාමයයි. ( )

- **අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න.**

11 ගුණ ජාතක කථාව තුළින් ........................................................ අගය මනාව පෙන්වා දී ඇත. ( අධිෂ්ඨානයේ / මෛත්‍රී කිරීමේ / කළගුණ සැළකීමේ )

12 ............................................................. සිටුතුමා ජේතවනාරාමය ඉදිකොට බුදු සසුනට පූජා කළේය. ( අනේ පිඬු / මෙණ්ඩක / මිගාර )

13 බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවට ලක් වූ ............................................................ තෙරුන් වහන්සේ නිරෝගී සුවය ලැබුවේය. ( උපාලි / පූතිගත්ත තිස්ස / ආනන්ද )

14 විසි දහසක් රහතන් වහන්සේලා සමග ............................................................ පුර පොහෝදා කිඹුල්වත් පුරවරයට බුදුරජාණන් වහන්සේ වැඩම කළ සේක. ( වෙසක් / පොසොන් / ඇසල )

15 බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා සෝවාන් වූ පළමු රජතුමා ............................................................ රජතුමා ය. ( කොසොල් / අජාසත්ත / බිම්බිසාර )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රශ්න වල " අ " තීරුවට ගැළපෙන පිළිතුරු " ආ " තීරුවෙන් තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

| | 'අ' තීරුව | | 'ආ' තීරුව |
|---|---|---|---|
| 16 | උපතිස්ස පිරිවැජියා | ( ) | 1. සුගතෝ |
| 17 | නව අරහාදී බුදු ගුණ | ( ) | 2. විරතිය |
| 18 | ඇම්. ඇල් සිල්වා ගුරු මුහන්දිරම් තුමා | ( ) | 3. සැරියුත් තෙරුන් |
| 19 | අකුසලයෙන් වෙන්වීම | ( ) | 4. කාව්‍ය ශේඛරය |
| 20 | තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් | ( ) | 5. සිරිත් මල්දම |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **දෙවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. දෙවන කොටසේ පළමු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි.**

1. (i) සුද්ධෝදන මහ රජතුමා විසින් තම රාජ්‍යයට ( කිඹුල්වත් පුරයට ) බුදුරජාණන් වහන්සේ කැඳවා ගෙන ඒමට යැවූ ඇමතිවරයා ගේ නම කුමක්ද?

(ii) අනපේක්ෂිතව විපත් රැසකට මුහුණ දී උමතු භාවයට පත්ව බුදුරජාණන් වහන්සේ ගේ පිහිට සොයා ගිය කාන්තාව කවුද?

(iii) බුදුරජාණන්වහන්සේ තුළ පැවති දැඩි වූ බඹුන් , දෙවියන් , යකුන් , මනුෂ්‍යයන් දමනය කිරීමේ ගුණය නම් කරන්න.

(iv) " සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා " යන ගාථා පාඨයෙහි අදහස ලියන්න.

(v) අනේපිඬු සිටුතුමාගේ දියණියන් තිදෙනාගෙන් දෙදෙනෙකුගේ නම් ලියා දක්වන්න.

(vi) විශාඛා උපාසිකාවෝ මරණින් මතු උපත ලද්දේ කොහේද?

(vii) ගිහි බෞද්ධයා අනුගමනය කළයුතු නිත්‍ය ශීලය කුමක් ද?

(viii) සිඟාලක ගෘහපතියාට බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය නම් කරන්න.

(ix) පුණ්ණ තෙරුන් වහන්සේ භාවනානුයෝගීව වැඩ සිටීමට පිටත්වූ ප්‍රදේශයේ නම ලියන්න.

(x) සැරියුත් මහරහතන් වහන්සේට පිරිනැමූ අගතනතුර කුමක්ද? (ලකුණු $2 \times 10 = 20$)

02 (i) පංච සීලයෙන් සිල් පද දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ඔබ නම් කළ එක් සිල් පදයක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 03)

(iii) " පන්සිල් සුරැකීමෙන් සිසු ජීවිතය යහපත් වේ " මෙම කියමන පැහැදිලි කරන්න. (ල. 05)

03 (i) බුදු සසුනේ අග්‍ර දායකයා හා දායිකාව නම් කරන්න. (ල. 02)

(ii) ඉන් එක් අයෙකු පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ල. 03)

(iii) මෙම චරිත ආදර්ශයට ගැනීමෙන් ශිෂ්‍යයකුට ලැබෙන ප්‍රයෝජන 05 ක් ලියන්න. (ල. 05)

04 (i) තුන් සූත්‍රයට අදාල සූත්‍ර වලින් දෙකක් ලියන්න. (ල. 02)

(ii) මෙත් වඩන්නකු තුළ තිබිය යුතු උසස් ගුණාංග තුනක් ලියන්න. (ල. 03)

(iii) නිවැරදිව භාවනාව ප්‍රගුණ කරගත් ශිෂ්‍යයකුට ලැබෙන ප්‍රයෝජන 05 සඳහන් කරන්න. (ල. 05)

05 (i) බුදුන් සරණ ගිය පළමු ( ද්වෙවාචික ) උපාසකවරුන් නම් කරන්න. (ල. 02)

(ii) පඨමං බෝධි පල්ලංකං .......................................... යන ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 03)

(iii) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමෙන් පසු අනිමිස ලෝචන පූජාවෙන් කළගුණ සැලකීම පෙන්වා දුන් සේක. ශිෂ්‍යයකු ලෙස ඔබ ජීවිතයේ එසේ කළගුණ සැලකීම කළ අවස්ථා පහක් ලියන්න. (ල. 05)

06 (i) බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයින් දෙදෙනකු නම් කරන්න. (ල. 02)

(ii) නම් කළ එක් අයෙකු පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 03)

(iii) අසරණ සරණ ගුණය ශිෂ්‍යයකුගේ යහ පැවැත්මට උපකාරීවන අන්දම පහදා දෙන්න. (ල. 05)

07 (i) සිරිත් විරිත් යන වචන දෙකේ අරුත් පැහැදිලි කරන්න. (ල. 02)

(ii) ආදර්ශවත් ශිෂ්‍යයෙකු වීමට පාසලේ දී ඔබ අනුගමනය කළ යුතු සිරිත් විරිත් 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) යහපත් බොදු දරුවකු වීමට අනුගමනය කළයුතු සිරිත් විරිත් පහක් සඳහන් කරන්න. (ල. 05)

| 7 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය 2018 | බුද්ධ ධර්මය |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) iii (02) ii (03) iv (04) i (05) iii (06) ✓ (07) ✓ (08) ✗
(09) ✓ (10) ✗ (11) කළගුණ සැළකීම (12) අනේපිඬු සිටුතුමා (13) පූතිගත්ත තිස්ස තෙරුණ්
(14) වෙසක් පුන් පොහෝදා (15) බිම්බිසාර (16) 3 (17) 1 (18) 5 (19) 2 (20) 4

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) කාළුදායි (ii) පටාචාරා (iii) පුරිසධම්ම සාරථී ගුණය
(iv) සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා (v) මහා සුභද්‍රා , චූල සුභද්‍රා , සුමනා
(vi) තුසිත දෙව්ලොව (vii) පංච සීලය
(viii) සිඟාලෝවාද සූත්‍රය (ix) සුනාපරන්ත දේශය (x) ධර්ම සේනාධිපති

02 (i) පන්සිල් පද පහෙන් දෙකක් නම් කර ඇත්නම් ලකුණු දෙන්න.
(ii) නම් කළ සිල් පදයේ තේරුම සමග ලියා ඇති විස්තරය පිළිබඳව සැළකිලිමත්ව ලකුණු පිරිනමන්න.
(iii) ගිහියාගේ නිත්‍ය සීලය පංච ශීලයයි. සෑම සියලු දෙනාම එය මනාව වටහාගෙන සුරැකීමෙන් ගිහි ජීවිතේ ගැටුම් අඩු වන බවත් ශිෂ්‍යයාගේ ඉගෙනුම් / ඉගැන්වීම් මෙන්ම විෂය භාහිර කටයුතු වලට ප්‍රයෝජනවත් වන ආකාරය පිළිබඳ ලියා ඇති තොරතුරු සැලකිල්ලට ගෙන ලකුණු පිරිනමන්න.

03 (i) අනේපිඬු සිටුතුමා / විශාඛා උපාසිකාව
(ii) ලියා ඇති පිළිතුරේ නිරවද්‍යතාව පිළිබඳ හා කරුණු පිළිබඳ සැළකිලිමත්ව ලකුණු පිරිනමන්න.
(iii) ආගමික නැඹුරුතාවය , ශ්‍රද්ධාව , ප්‍රති උපකාර කිරීම , එකිනෙකා අතර සුහදශීලී බව , ඉගෙනීමේ කටයුතු හොඳින් ඉටුකර ගැනීමට , චරිතායනය කිරීම ආදී ලියා නැති කරුණු වල නිරවද්‍යතාවය ගැන සැලකිළිමත්ව ලකුණු පිරිනමන්න.

04 (i) රතන සූත්‍රය , මහාමංගල සූත්‍රය , කරණීය මෙත්ත සූත්‍රය
(ii) පස්වන පාඩමේ ඇති කරුණු 15 න් තුනක් ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න. ( මනස පුබුදන නුවණැස පාදමු )
(iii) මානසික ඒකාග්‍රතාවය ඇති වීම , මතක ශක්තිය වැඩිවීම , නිවැරදි අවබෝධය , ඉවසීම , අන්‍යමත වලට ගරු කිරීම , සුහද ශීලී බව ආදී කරුණු ලියා ගැලපෙන පිළිතුර කට සමස්ථය ගැන බලා ලකුණු දෙන්න.

05 (i) තපස්සු භල්ලුක
(ii) පඨමං බෝධි පල්ලංකං - දුතියංච අනිම්මිසං
තතියං චංකමණං සෙට්ඨං - චතුත්ථං රතනාඝරං
පංචමං අජපාලංච - මුචලින්දේන ඡට්ඨමං
සත්තමං රාජායතනං - වන්දේතං මුනි සේවිතං
(iii) ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සිතා ලකුණු පිරිනමන්න.

06 (i) සුනීත, සෝපාක , පටාචාරා , කිසා ගෝතමී , රජ්ජුමාලා , අසරණ මහලු පියා , වරදට හසු වූ නිවැරදි ගොවියා , පූතිගත්තතිස්ස තෙරුන්
(ii) හඳුන්වා ඇති එක් අසරණයකු පිළිබඳව දක්වා ඇති කරුණු වල නිරවද්‍යතාව ගැන සැළකිලිමත්ව ලකුණු පිරිනමන්න.
(iii) යහපත් සමාජ පුරුෂයකු වීම සඳහා ශිෂ්‍ය ජීවිතය නිවැරදිව සකසා ගැනීම ඉතා වටී. කුඩා කල සිටම අසරණයින්ට පිහිට වී දානමානා දී , පිංකම් කර කටයුතු කිරීම අනාගත අභිවෘද්ධිය සඳහා මහඟු පිටුවහලක් වේ. මෙවැනි තොරතුරු ද සමගින් ලියා ඇති සමස්ථ පිළිතුර සම්බන්ධයෙන් සැළකිලිමත්ව ලකුණු ප්‍රදානය කරන්න.

07 (i) කළයුතු හා වැළකිය යුතු සමාදාන හා විරමනය
(i) " දිවි සර සන සිරිත විරිත " යන පාඩමේ 30 පිටුවේ අන්තර්ගත කරුණු හා ගැලපෙන වෙනත් කරුණු කෙරෙහි සැළකිළිමත්ව අදාල පරිදි ලකුණු ප්‍රදානය කරන්න.
(iii) ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සිතා ලකුණු පිරිනමන්න.